**ශීර්ෂය 418 - බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 17දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු මෙම වාර්තාවේ 1.6.1 (ඇ) හා 1.6.2 යන ඡේදයන්හි දැක්වෙන නිරීක්ෂණයන් හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

## 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භෞතික වත්කම් අත්පත් කරගැනීම්වල වටිනාකම ACA- 6 හි දැක්වෙන පරිදි රු. 6,603,739 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ භෞතික වත්කම් අත්පත් කර ගැනීම්වල වටිනාකමට මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ගැනෙන වියදම් එකතු කර රු.320,757,336 ක් ලෙස දැක්වීමෙන් ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් වැයකිරීම් රු. 314,153,597 කින් වැඩියෙන් හා මෙහෙයුම් ක්‍රියාකරකම් සඳහා මුදල් වැයකිරීම් වටිනාකම රු.314,153,597 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ආකෘති අංක ඒ.සී.ඒ.2 (ii)හි රාජ්‍ය ආයෝජනයන්හි මුළු වියදම ලෙස දක්වා ඇති රු.320,757,336ක වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් යටතේ දක්වා ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නිවැරදිව ගිණුම්ගත කල යුතු වීම. |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය විසින් මිලදී ගන්නා ලද රු.4,706,999 ක්වූ ටයර්වල වටිනාකම මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණු බැවින් මූල්‍ය නොවන වත්කම් රු. 4,706,999 කින් වැඩියෙන් පෙන්නුම් කර තිබුණි. | මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා ඇති රු. 4,706,999.00 ක් වූ ටයර්වල වටිනාකම ඉන් ඉවත්කර මූල්‍ය නොවන වත්කම්හි අගය නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදි. | මූල්‍ය නොවන වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වීම. |
| (ආ) | පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනය වන විට වැඩ නිම කරන ලද රු.246,200,000 ක්වූ ගොඩනැඟිලි ඉදිකිරීම් ප්‍රාග්ධනිත කර ගිණුම්ගත කිරිමට කටයුතු කර නොතිබුණි. | ඉදිකිරීම් වලට අදාල සියලුම ගෙවීම් වවුචර්පත් නිසි පරිදි ගිණුම්කරණ පද්ධතියට ඇතුළත් කර ගෙවීම් සිදු කර ඇතත් ප්‍රාග්ධනිත කරනොමැති අතර කඩිනමින් ගිණුම්ගත කිරීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදි. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුල පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය පිහිටි ගොඩනැගිල්ල වෙනුවෙන් කුලී අත්තිකාරම් මුදල් ලෙස රු ,ක්ද7,690,560. වැඩ අත්තිකාරම් මුදල් ලෙසරු . .ක්ද ගෙවා තිබුණි 19,327,232එසේ වුවද, මෙම කුලී හා වැඩ අත්තිකාරම් මූල්‍ය ප්‍රකාශන තුල සටහන් කර නොතිබීම හේතුවෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය වත්කම් යටතේ කුලි හා වැඩ අත්තිකාරම් ගිණුමේ හා සංචිත ගිණුමේ රු 27,017,792 .ක් අඩුවෙන් දක්වා තිබුණි. | මින් ඉදිරියේදී මෙවැනි ගෙවීම් කිරීමේදී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව කාර්යාංශයේ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කල යුතු වීම. |
| (ඈ) | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දැක්වෙන වටිනාකම රු.287,982,491 ක්වූ මූල්‍ය නොවන වත්කම් භෞතිකව පරීක්ෂා කර තහවුරුවක් ලබාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කළ වහාම මූල්‍ය නොවන වත්කම් සඳහා කළ යුතු ගැළපීම් කිරීමට කටයුතු කරමි. | -එම- |

## 1.6.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කල යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මාසිකව මෙම අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනවල ප්‍රගතිය සමාලෝචනය කරනු ලබයි. එහිදී මූල්‍ය ප්‍රගතිය, ප්‍රසම්පාදන කටයුතුවල ප්‍රගතිය, සංවර්ධන ව්‍යාපෘතීන් හි ප්‍රගතිය හා පොදුවේ ආයතනවල අභ්‍යන්තර පාලන ගැටළු සාකච්ඡා කෙරේ. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණය අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | - එම - | - එම - |

**1.6.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1641 හා 1642 | සමාලෝචිත වර්ෂයේදි අංක KQ – 5420 දරන වාහනය රු. 51,000 ක් වැයකර අළුත්වැඩියා කටයුතු සිදු කලද අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | එකඟ වෙමි. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කලමනාකරණ චක්‍රලේඛයේ 02 (i) ඡේදය | ලියාපදිංචි අයිතිය නොමැතිව පරිහරණය කරන වාහන ලියාපදිංචි ආයතනයේ එකඟතාවය මත තම ආයතනය නමින් ලියාපදිංචි කර ගැනීමට කටයුතු කල යුතු වුවද, අහෝසි වී ගිය අමාත්‍යාංශයෙන් පවරන ලද වාහන 15 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ලියාපදිංචිය වෙනස් කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |
| (ඇ) 2019 දෙසැම්බර් 04 දිනැති අංක 07/2019 දරන අයවැය චක්‍රලේඛයේ 02 ඡේදය | නිසියාකාර වියදම් පාලන නිර්ණායක යෙදීමත් එම නිර්ණායක මඟින් වියදම් පාලනය වන බව සනාථ කරගැනීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරිගේ වගකීමක් බව අවධාරණය කර තිබියදීත්, පුනරුත්ථාපන මධ්‍යස්ථාන ආරම්භ | නව මධ්‍යස්ථාන ආරම්භ කිරීමට අදාල ගොඩනැගිලි පවරා ගැනීමේ කටයුතු ක්‍රියාත්මක වන තෙක් අදාල මධ්‍යස්ථාන පවරා ගැනීමෙන් පසු කඩිනමින් පුනරුත්ථාපන කටයුතු ආරම්භ කිරීමට අදාළ මූලික | -එම- |

| | | | |
|---|---|---|---|
| | කල හැකි කාල වකවානු නිශ්චිතව හඳුනාගත නොහැකි තත්වයක් තුල සමාලෝචිත වර්ෂයේ රු.61,801,989 ක භාණ්ඩ මිලදීගෙන තිබුණි. | අවශ්‍යතා ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ මිලදී ගැනීමට කටයුතු කරන ලදි. පවරා ගැනීමේ කටයුතු අවසන් වූ පසු කඩිනමින් පුනරුත්ථාපන කටයුතු ආරම්භ කිරීමට කටයුතු සූදානම් කොට තිබුණි. | |
| (ඇ) 2021 අප්‍රේල් 09 දිනැති අංක CGIR/2021/02–02 දරන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ ලිපිය හා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 5.4.12 මාර්ගෝපදේශය | සමාලෝචිත වර්ෂය තුල බාහිර පාර්ශවයන් වෙතින් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී ගෙවා ඇති රු. 162,898 ක වැට් බදු මුදල් සම්බන්ධයෙන් දී ඇති උපදෙස් ප්‍රකාරව කාර්තුවක් අවසානයේ ඊලඟ මාසයේ 15 දින හෝ ඊට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත දන්වා යැවීමට කටයුතු කර නොතිබුණි. | අතපසුවීමකින් වාර්තා කිරීමට අපොහොසත් වූ සංශෝධිත වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කරමි. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |
| (ඉ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ I කොටසේ 13.2 ඡේදය සහ මුදල් රෙගුලාසි 770 (4) (අ) | පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයට අයත් අපහරණය කල යුතු වාහන 03 ක් චක්‍රලේඛය පරිදි සමාලෝචිත වර්ෂය තුලදී අපහරණය කිරිමට කටයුතු කර නොතිබුණි. | මෙම වාහන සම්බන්ධයෙන් සිදු කළ යුතු ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමට කටයුතු කර ඇත. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පුනරාවර්තන වැය විෂයයක හා ප්‍රාග්ධන වැය විෂයයන් 03ක් වෙනුවෙන් වෙන් කරන ලද රු. 3,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි. | 2021.08.31 දිනැති 21/1596/304/134 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉතිරි කිරීම හේතුවෙන් ද, පූර්ණ කාලීන අමාත්‍යවරයෙක් පත් නොවීම මත වියදම් අවශ්‍යතා සීමා වීම හේතුවෙන් මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය නොවී ඉතිරි වී ඇත. | මුදල් ප්‍රතිපාදන නියමිත පරිදි සැලසුම් කර ඇස්තමේන්තු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) පුනරාවර්තන වැය විෂයයන් 07ක හා ප්‍රාග්ධන වැය විෂයයන් 03කට අදාලව සියයට 50කට වඩා වැඩියෙන් ඉතිරිවීම් දක්නට ලැබුණි. තවද, වැය විෂයයන් 04 කට මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කිරීම් සිදුකිරීමෙන් අනතුරුවත් සියයට 66 සිට සියයට 91 දක්වා පරාසයක ඉතිරිවීම් තිබූ බව නිරීක්ෂණය විය. | 2021.08.31 දිනැති 21/1596/304/134 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පූර්ණ කාලීන අමාත්‍යවරයෙක් පත් නොවීම මත වියදම් අවශ්‍යතා සීමා වීම, අරපිරිමැස්මෙන් යුතුව කටයුතු කිරීම හේතුවෙන් ඉතිරි වී ඇත. තවද කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානය සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ කොවිඩ් රෝහලක් බවට පත් කිරීම හේතුවෙන් එහි සැලසුම් කළ සංවර්ධන කටයුතු සිදු කිරීමට නොහැකි වීම නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | -එම- |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් බැදීම් හා බැරකම් ප්‍රකාශයේ පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයට අයත් වැය විෂයයන් 02 කට අදාලව රු.4,569,561 ක වටිනාකමින් යුත් බැරකම් අඩුවෙන් දක්වා තිබුණි. | කාර්යාංශයේ දෙසැම්බර් මසට අදාළ අතිකාල දීමනා, සලාක හා ඉන්ධන බිල්පත් (යුද්ධ හමුදාපති) ගෙවල් කුලී බිල්පත් සහ වාහන බිල්පත් ඊළඟ වර්ෂයේ ජනවාරි හෝ පෙබරවාරි මාසයන් තුළදී ලබාදෙන බැවින් විසර්ජන ගිණුමට ඇතුළත් කිරීමට හැකියාවක් නොමැත. | බැරකම් වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම. |
| (ආ)පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය විසින් ගොඩනැඟිලි ඉදිකිරීම් වෙනුවෙන් බාහිර පාර්ශවයන් වෙත ඇති බැදීම් වටිනාකම වූ රු.346,210,705 ක් 2021 දෙසැම්බර් 31 දිනට බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවන ලෙස බැදීම් ගිණුම්ගත කළ යුතු ආකාරය පිළිබඳව අදාළ ආයතනයට උපදෙස් ලබා දෙන ලදි. | -එම- |

## 2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැඩ තහනමට ලක් වූ නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු. 229,320 ක්වූ ආපදා ණය ශේෂය වර්ෂ 05 කට වැඩි කාලයක සිට හා මියගිය නිලධාරියකුගෙන් අයවිය යුතු රු. 10,000 ක ආපදා ණය ශේෂය වර්ෂ 2ට වැඩි කාලයක සිට පවතින නමුත් එම ශේෂයන් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වැඩ තහනමට ලක් වූ නිලධාරීන්ගෙන් හා තනතුර අතහැර ගොස් ඇති නිලධාරීන්ගෙන් රජයට අයවිය යුතු ආපදා ණය හා උත්සව අත්තිකාරම් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග සඳහා යොමු කර ඇත.<br>මියගිය නිලධාරියාගේ ණය මුදල මෙම වසර තුලදී නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. | නියමිත කාල සීමාව තුළදී ණය ශේෂ අයකර ගත යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අමාත්‍යාංශය විසින් මූලධන වත්කම් අත්පත් කර ගැනීමට රු.මිලියන 9.5 වැය කර තිබුණද, 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 (අ) ප්‍රකාරව දැන්වීම් පලකිරීම ආර්ථික වශයෙන් අවාසි සහගත වන අඩු වටිනාකමින් යුත් අයිතමයන් ප්‍රසම්පාදනය කිරීම සඳහා හෝ නිතර භාවිත කරන අයිතමයන් මිලදී ගැනීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කල යුතු වුවද, 2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සිදුකර නොතිබුණි. | මිලදී ගැනීම් හා අනෙකුත් ප්‍රසම්පාදන කටයුතු සඳහා රාජ්‍ය අමාත්‍යාංශයට වෙන් වූ ප්‍රතිපාදනය සීමිත ප්‍රමාණයක් වූ බැවින් සැපයුම්කරුවන් ලියාපදිංචි නොකරන ලදි. ඒ අනුව දුරකථන නාමාවලියෙහි දේදුනු පැහැති පිටුවල ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන් ලැයිස්තුවෙන් මිල ගණන් කැඳවීමට කටයුතු කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නියමිත පිරිවිතර සැපයුම්කරුවන්ට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු. 1,227,889 ක් වටිනා බිම් අතුරන යෙදීම හා Work Station සවිකිරීමේ කාර්යයන්හිදී අවම මිල පමණක් සැලකිල්ලට ගනිමින් සැපයුම්කරු තෝරාගැනීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම තුල 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (ඊ) පරිදි ඇගයීමේ හා තේරීමේ කාර්යය පටිපාටියේ විනිවිදභාවය හා නිත්‍යභාවය සහතිකවී නොතිබුණි. | ඉදිරියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි උපදෙස්වලට අනුකූලව පිරිවිතර සකස් කර ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට කටයුතු කරමි. | -එම- |

**3.2 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 ජුලි 01 දින අනතුරකට ලක්වී ඇති PH-1288 දරන කැබ් රථයේ අළුත්වැඩියා කිරිමේ වියදමරු.2,290,015ක්වූ අතර මෙයින් රු.1,698,894ක් ජාතික රක්ෂණ භාර අරමුදලෙන් ලැබී තිබුණු අතර ඉතිරි මුදල වූ රු.591,120 ක් සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයට වැය බරක් වීමෙන් එම අලාභය සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2018 වර්ෂයේ දී එවකට ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා අමාත්‍යාංශයට අයත්ව තිබූ අංක PH – 1288 දරණ කැබ් රථයට සිදු වූ අලාභයකි. | අමාත්‍යාංශය විසින් දරන ලද වියදම් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගතයුතු වීම. |

**3.3 කළමනාකරණ දූර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාහන 3ක් සම්බන්ධයෙන් අළුත්වැඩියාවන් නිසි පරිදි සිදුකර ඇති බව තාක්ෂණික ඉංජිනේරුවරයා විසින් නිර්දේශ කර නොතිබියදී 2021 දෙසැම්බර් 31 දින රු. 1,394,835 ක් වටිනා වවුචර් අනුමත කර ගෙවීම් සිදුකර තිබුණි. | වාහන අලුත්වැඩියා කර අවසන් වුවත් තාක්ෂණික ඉංජිනේරු නිර්දේශය ලබා ගැනීමට ප්‍රමාද විය. | තාක්ෂණික ඉංජිනේරුවරයා විසින් නිර්දේශ කිරීමෙන් අනතුරුව ගෙවීම් වවුචර් අනුමත කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය පිහිටි ගොඩනැඟිල්ලේ තක්සේරු වාර්තාව ලබාගැනීමට හා ගොඩනැඟිලි හිමිකරු සමඟ ගිවිසුමට එළඹීමටත් පෙර අදාල ආයතනය සමඟ රු.8,380,420 ක මුදලකට ගොඩනැඟිල්ලේ කාර්යාල බෙදා වෙන්කිරීම් කාර්යය සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. තවද, මාසික කුලී වටිනාකම රු. 2,400,000 ක් ලෙස තක්සේරු කර තිබුණු එකී ගොඩනැඟිල්ල සඳහා එම තක්සේරු වටිනාකමට වඩා රු.163,520 කින් වැඩි කුලී වටිනාකමකට ගිවිසුම්ගතවී තිබීම හේතුවෙන් වසර 02 ක කාලයක් සඳහා රු. 3,924,480 ක කුලී මුදලක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි. | තක්සේරු මුදල සඳහා ගොඩනැගිලි හිමිකරු එකඟ නොවීම හා වෙනත් ගොඩනැගිල්ලක් බත්තරමුල්ල ප්‍රදේශයෙන් සොයා ගැනීමට නොහැකි වූ බැවින්ද රු.2,563,520 ක මාසික කුලියකට ගොඩනැගිල්ල ලබා ගැනීමට ගිවිසුම් ගත වී ඇති අතර අවශ්‍යතාවය අනුව උපරිමයෙන් ගොඩනැගිල්ල භාවිත කරයි. | තක්සේරු වාර්තාවක් ලබා ගැනීමෙන් අනතුරුව ගිවිසුම්වලට එළඹිය යුතු වීම. |
| (ඇ) | කාර්යාංශය විසින් ගොඩනැගිලි අවශ්‍යතාවය වර්ග අඩි 15000 සිට 16000 ක් ලෙස දැන්වීම් පලකර තිබියදී වර්ග අඩි 14,524 ක ප්‍රසම්පාදන කොමිෂන් සභා කාර්යාලය පිහිටි ගොඩනැඟිල්ල රු. 2,454,556 ක මාසික කුලී මුදලකට මිලදී ගැනීමට හැකියාව තිබියදී වර්ග අඩි 19,858 ක ගොඩනැගිල්ලක් රු. 2,563,520 කට කුලියට ගැනීම නිසා මාසිකව රු.108,964 ක් බැගින් වැඩිපුර ගෙවීමට සිදුවීමත් ඊට අමතරව ස්ථාවර වත්කම්, පරිගණක ජාලය හා කොටස් වෙන්කිරීම් සහිත එකී ගොඩනැගිල්ල ලබාගැනීමෙන් ලැබීමට තිබූ ආර්ථික වාසිය අහිමි වී ගොස් තිබුණි. එම හේතුවෙන් අමාත්‍යාංශය විසින් නියමිත කාලවකවානුව තුලදී නිසි තීරණ නොගැනීම නිසා වර්ෂ 2ක් සඳහා වැඩිපුර කුලී මුදල් ලෙස රු. 2,615,136 ක් හා කාමර වෙන්කිරීම් හා පරිගණක ජාලගත කිරිම සඳහා රු.10,642,740 ක | ප්‍රසම්පාදන කොමිෂන් සභා කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලේ හිමිකරු විසින් වර්ග අඩියක් රු. 169 බැගින් වර්ග අඩි 14524 ක්රු. 2,454,556ක මාසික කුලියකට සැපයිය හැකි බව දැන්වුවද, නැවත ලිපියක් යොමු කරමින් වර්ග අඩි 12599 ක් එකී මිලටද, ඉතිරි වර්ග අඩි 1925 ප්‍රමාණය තක්සේරු කර එම මුදලද ඉන් පසුව ලබාදෙන ලෙස දන්වා ඇත. | රාජ්‍ය වියදම් නිසි පරිදි කළමනාකරණය කරගත යුතු වීම. |

| | | |
|---|---|---|
| අමතර පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි. | | |
| (ඈ) 2017 නොවැම්බර් 22 දිනැති අංක අමප/17/2509/745/016 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය පනත් කෙටුම්පත සකස්කිරීම සඳහා අනුමැතිය ලබාදී තිබුණු අතර, කාර්යාංශයට 2021 අප්‍රේල් 28 දිනැති අංක අමප/21/0564/330/029 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් පනත් කෙටුම්පත සඳහා නිතිපතිතුමාගේ නිෂ්කාශනය සමඟ අමාත්‍ය මණ්ඩලය වෙත නැවත ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටියද, සමාලෝචිත වර්ෂය අවසානය තෙක් පනත් කෙටුම්පතට අදාල කටයුතු නිමකර නොතිබුණි. | මේ වන විට අදාළ කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් නීතිපති වෙත යොමු කර ඇති බව වාර්තා වන අතර මෙම කටයුතු පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලය මගින් සම්බන්ධීකරණය කරනු ලබයි. | පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයේ පනත් කෙටුම්පත සකස්කිරීම කඩිනම් කල යුතු වීම. |

**4. යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තිය හා 40 (2) (1) වගන්තිය ප්‍රකාරවඅභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීම සඳහා කාර්ය මණ්ඩල අවශ්‍යතාවය දක්වමින් රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ඇනුවත් කර ඇතත් 2021 වර්ෂය තුල නිලධාරියෙකු අනුයුක්ත කර නොතිබුණි. එසේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ඇතුලු කාර්ය මණ්ඩලය ලබා දුන් වහාම අභ්‍යන්තර විගණන ඒකකයේ වැඩ කටයුතු ආරම්භ කළ හැකි බව දන්වමි. | පනත් විධිවිධානයන්ට අනුකූලව කටයුතු කළ යුතු බව. |

## 4.2 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01-2019 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 5.3 ඡේදය පරිදි අවම වශයෙන් කාර්තුවකට වරක් වර්ෂයකට 4 ක් වන පරිදි රැස්වීම් පැවැත්විය යුතු වුවද, එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. | 2021 වර්ෂය තුල ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවති බැවින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි වී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 150 ක් වුවද, තත්‍ය කාර්ය මණ්ඩලය 62 ක් පමණක් වූ අතර සමාලෝචිත වර්ෂය තුලදි පුද්ගල පඩිනඩි වෙනුවෙන් රු. 45,436,136 ක් වැයකර තිබුණි. | අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ ද්විතියික මට්ටමේ අනුමත තනතුරු 58ක් (සංවර්ධන නිලධාරි තනතුරු) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ DMS/1148-ii හා 2021.12.31 දිනැති ලිපිය මගින් යටපත් කර ඇත. | කාර්ය මණ්ඩල අවශ්‍යතාවයන් නිවැරදිව පුරෝකථනය කළ යුතු වීම. |